## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 09

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

***කාලය පැය 03 යි***
***සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.***
***අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.***

1. 124 යන ෂඩ්දශමය (Hexadecimal) සංඛ්‍යාවට තුල්‍යවන දශමය සංඛ්‍යාව වනුයේ,
(1) 272 (2) 112 (3) 292 (4) 332

2. 256 යන අෂ්ටක (Octal) සංඛ්‍යාවට තුල්‍යවන දශමය සංඛ්‍යාව වනුයේ,
(1) 128 (2) 174 (3) 142 (4) 188

3. 32 යන ෂඩ්දශමය සංඛ්‍යාවට තුල්‍යවන ද්විමය (binary) සංඛ්‍යාව වනුයේ,
(1) 110100 (2) 110010 (3) 101101 (4) 11110

4. 110 යන ද්විමය සංඛ්‍යාව 1010 ද්විමය සංඛ්‍යාවෙන් අඩු කළ විට ලැබෙන පිළිතුර වනුයේ,
(1) 10 (2) 111 (3) 101 (4) 100

5. නිබලයකට (Nibble) වඩා කුඩා වන්නේ,
(1) බිටු 2 කි (2 bits) (2) බයිට 2 කි (2 bytes) (3) බිටු 8 කි (8 bits) (4) බිටු 32 කි (32 bits)

6. A+A යන තාර්කික ප්‍රකාශනයට සර්වසම වන්නේ,
(1) 0 (2) 1 (3) 2A (4) A

7. පහත දී ඇති සත්‍යතා වගුවෙන් (Truth Table) නිරූපණය වන තාර්කික මෙහෙයුම වනුයේ,

| Input 1 | Input 2 | Input 3 | Output |
|---|---|---|---|
| 0 | 0 | 0 | 0 |
| 0 | 0 | 1 | 1 |
| 0 | 1 | 0 | 1 |
| 0 | 1 | 1 | 0 |
| 1 | 0 | 0 | 1 |
| 1 | 0 | 1 | 0 |
| 1 | 1 | 0 | 0 |
| 1 | 1 | 1 | 0 |

(1) XOR (2) NAND (3) AND (4) OR

8. පහත දැක්වෙන තාර්කික පරිපථයේ A, B හා C හි අගයයන් පිළිවෙලින් වන්නේ,




(1) 0,0 හා 1 (2) 0,1 හා 0 (3) 1,0 හා 1 (4) 1,1 හා 0

9. 1001 1001 1001 යන BCD කේතය තුල්‍ය වන්නේ,
(1) 998 (2) 999 (3) 222 (4) 899

10. පද්ධති ජීවන සැලසුම් චක්‍රයේ දී (SDLC) පද්ධති අවශ්‍යතා හඳුනා ගැනීම හා අදාළ අවධිය (Phase) වනුයේ,
(1) පද්ධති විශ්ලේෂණය (Analysis)
(2) පද්ධති සැලසුම් නිර්මාණය කිරීම (Design)
(3) පද්ධති වැඩිදියුණු කිරීම (Development)
(4) පද්ධති නඩත්තුව (Maintenance)

11. කාර්යසාධනය (performance) සොයා බැලීම, සමාගම කළමනාකරණය කිරීම සහ මධ්‍ය කළමනාකාරිත්වය (middle level Management) කේන්ද්‍ර කර ගැනීම හා අදාළ තොරතුරු පද්ධති වර්ගය වනුයේ,
(1) කළමනාකරණ තොරතුරු පද්ධතිය (Management Information System)
(2) තීරණ සහායක පද්ධතිය (Decision Support System)
(3) මානව සම්පත් පද්ධතිය (Human Resource System)
(4) ගනුදෙනු සැකසීම් පද්ධතිය (Transaction Processing System)

12. පද්ධති කඩිනම් ක්‍රියාවේ යෙදවීම (Plunge implementation) අවධිය හා අදාළ වන්නේ,
(1) පැරණි පද්ධතිය භාවිතයෙන් සම්පූර්ණයෙන් ඉවත් කර, යුහුසුළුව නව පද්ධතිය භාවිතා කිරීම ඇරඹීමයි,
(2) නව පද්ධතිය මනාව ක්‍රියා කරන බව තහවුරු කර ගන්නා තෙක් නව පද්ධතිය හා පැරණි පද්ධතිය යන දෙකම භාවිතා කිරීමයි.
(3) නව පද්ධතිය භාවිතා කිරීමට කුඩා කණ්ඩායමකට පමණක් ඉඩ ලබා දීමයි.
(4) නව පද්ධතිය ආංශිකව (Phased) ක්‍රියාවේ යෙදවීමයි.

13. පද්ධති ක්‍රියාවේ යෙදවීම් (Implementation) ආකාරයක් නොවන්නේ,
(1) ඒකක ක්‍රියාවේ යෙදවීම් (Unit implementation)
(2) නියමු ක්‍රියාවේ යෙදවීම් (Pilot implementation)
(3) ආංශිකව ක්‍රියාවේ යෙදවීම් (Phased implementation)
(4) කඩිනම් ක්‍රියාවේ යෙදවීම් (Plunge implementation)

14. නූතන මෙහෙයුම් පද්ධති (Operating Systems) සමඟ ආකලනය (Integrated) කර ඇති කුඩා වැඩසටහන් වර්ගයක් වන්නේ,
(1) ධාවක (Drivers)
(2) අතුරු බිඳුම් (Interrupts)
(3) වෛරස ස්කෑනරය (Virus scanner)
(4) පද්ධති කැඳවීම් (System calls)

15. වින්ඩෝස් (Windows) මෙහෙයුම් පද්ධතියේ විවෘතව ඇති වැඩසටහනක් වසා දැමීම සඳහා ක්ලික් කළ යුතු බොත්තම වන්නේ,




(1) 1
(2) 2
(3) 3
(4) ඉහත පෙන්වා නොමැත.

16. මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) හි උද්දීපනය කරන ලද පෙළක් (Highlighted text) සඳහා Ctrl+I යතුරු පහර යොදා ගත් විට පහත කවරක් බවට පත් වේ ද?
(1) තද අකුරු (Bold) පෙළක්
(2) ඉතාලි අකුරු (Italic) පෙළක්
(3) යටින් ඉරි ඇඳි (Underline) පෙළක්
(4) බුලටමය ලැයිස්තුවක් (Bulleted list)

17. මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) හි 'Find and Replace' විකල්පය ලබා ගැනීමට යොදා ගත යුතු යතුරු පහර වන්නේ,

(1) Ctrl+X (2) Ctrl+P (3) Ctrl+F (4) Ctrl+S

18. අක්ෂර හැඩතල ගැන්වීම (Character formatting) පිළිබඳව පහත කුමන වගන්තියක් සත්‍ය වේ ද?
(1) පිටුවක ඇති අක්ෂරවල පෙනුම වෙනස් කිරීම, අක්ෂර හැඩතල ගැන්වීම නම් වේ.
(2) පෙරනිමි පැති තීර (Default side margins) වෙනස් කිරීම, අක්ෂර හැඩතල ගැන්වීමේ දී සිදු ක
(3) ශීර්ෂකය (Header) සහ පාදතලය (Footer), අක්ෂර හැඩතල ගැන්වීම් සඳහා උදාහරණ වේ.
(4) මුද්‍රණය කිරීම (Printing), අක්ෂර හැඩතල ගැන්වීම් ආකාරයකි.

19. අන්තර්ජාලය (Internet) පිළිබඳව පහත කවරක් නිවැරදි අර්ථකථනයක් නොවේ ද?
(1) පරිගණක ජාල (Networks) සමූහයක් එකිනෙකට සම්බන්ධ කිරීමෙන් අන්තර්ජාලය නිර්මාණය අතර, විද්‍යුත් තැපැල් ලිපි (e-mail) සහ විශ්ව විසිරි වියමන (www) ඔස්සේ සන්නිවේදන කිරීමට ඉඩකඩ ලබා දෙයි.
(2) තනි පුද්ගලයෙකුට හෝ යම්කිසි කණ්ඩායමකට පමණක් අයිති නොවන පොදු පරිගණක ජා (Public network)
(3) ලොව වටා ඇති පරිගණක මිලියන ගණනක් එකිනෙකට සම්බන්ධ කෙරෙන සුවිශාල පරිග ජාලයකි.
(4) රාජ්‍ය ආයතනයක් මඟින් පවත්වා ගෙන යනු ලබන තොරතුරු නාමාවලියකි (Catalogue)

20. XML යනුවෙන් ප්‍රකාශ වන්නේ,
(1) Extreme Markup Language
(2) Extensible Markup Language
(3) Expert Markup Language
(4) External Markup Language

21. දත්ත සමුදායක් (Database) යනු,
(1) වැඩසටහන් (Programs) නිර්මාණය කිරීම සඳහා ඇති මෙවලමකි (Tool).
(2) ශ්‍රව්‍ය පසුරු (Audio clips) mp3 ගොනු ආකාරයට හරවන වැඩසටහනකි.
(3) රෙකෝඩ (Records) වල එකතුවකි.
(4) රූප සංස්කරණය (Edit) කිරීම සඳහා ඇති වැඩසටහනකි.

22. දත්ත සමුදාය වගුවක (Database table) තීරුවක් හැඳින්වීමට යොදා ගන්නා පදය වන්නේ,
(1) උපලක්ෂණය (Attribute)
(2) ක්ෂේත්‍රය (Field)
(2) රෙකෝඩය (Record)
(4) සබැඳිය (Relation)

23. දත්ත සමුදාය වගුවක ඇති රෙකෝඩ (Records) කිහිපයක් පමණක් දර්ශනය කර ගැනීම සඳහා නිර්මාණය කළ යුත්තේ,
(1) වාර්තාවකි (Report)
(2) සම්බන්ධතාවයකි (Ralationship)
(2) විමසුමකි (Query)
(4) ක්ෂේත්‍රයකි (Field)

24. මයික්‍රොසොෆ්ට් එක්සෙල් (Microsoft Excel) පැතුරුම්පතක (Spreadsheet), A5 කෝෂයේ ( AVERAGE (A1:A4) ශ්‍රිතය අන්තර්ගත වී ඇත. A1, A2, A3 සහ A4 කෝෂවල අගයයන් පහත වන විට A5 කෝෂයේ දර්ශනය විය යුතු අගය වන්නේ,

| Cell | Value |
|---|---|
| A1 | 60 |
| A2 | 40 |
| A3 | 30 |
| A4 | 30 |

(1) 30 (2) 60 (3) 40 (4) 20

25. එක්සෙල් (Excel) පැතුරුම්පතක නිර්මාණය කළ හැකි ප්‍රස්ථාර වර්ගයක්/වර්ග වන්නේ,
(1) තීරු ප්‍රස්ථාර (Bar charts)
(2) රේඛා ප්‍රස්ථාර (Line charts)
(3) වට චිත්‍රක ප්‍රස්ථාර (Pie charts)
(4) ඉහත සියල්ල

පහත දී ඇති පැතුරුම්පත (Spreadsheet) අධ්‍යයනය කර 26, 27 හා 28 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | The Firm - Outsourcing personified | | |
| 3 | | | | | |
| 4 | | Clients | Contracts | Total Value of contracts (million) | Avg value of contract (million) |
| 5 | | BP | 3 | $130.00 | $43.33 |
| 6 | | LogicaCMG | 4 | $85.00 | $21.25 |
| 7 | | Accenture | 12 | $1,400.00 | $116.67 |
| 8 | | HP | 1 | $90.00 | $90.00 |
| 9 | | Jaguar | 14 | $120.00 | $8.57 |
| 10 | | Goldman Sachs | 5 | $5,000.00 | $1,000.00 |
| 11 | | | | | |
| 12 | | | | | |
| 13 | | | | | |
| 14 | | Total | 39 | $6,825.00 | $1,279.82 |
| 15 | | | | | |
| 16 | | | | | |
| 17 | | | | | |

26. E7 කෝෂයේ අඩංගු විය යුතු සූත්‍රය/ශ්‍රිතය වන්නේ,
(1) = D7/C7 (2) = SUM (D7/C7) (3) = SUM (D7:C7) (4) D7/C7

27. B14 කෝෂයේ අඩංගු වී ඇත්තේ,
(1) ලේබලයකි (Label) (2) අගයකි (Value)
(3) සූත්‍රයකි (Formula) (4) සිරස්තලයකි (Heading)

28. D14 කෝෂයේ අඩංගු විය යුතු සූත්‍රය/ශ්‍රිතය වන්නේ,
(1) = D5:D10 (2) :SUM (D4:D14)
(3) = SUM (D5:D10) (4) = D4:D14

29. පැස්කල් (Pascal) හි යොදා ගන්නා වෙන් කළ වචනයක් (Reserved word) වන්නේ,
(1) function (2) name (3) Reg No (4) english

30. පහත කුමක් පැස්කල් (Pascal) හි භාවිතාවන වලංගු කාරකයක් (Operator) නොවේ ද?
(1) <> (2) =< (3) > (4) >=

31. green, blue සහ red ලෙස අගයයන් ඇති Party නම් වූ ගණනා දත්ත වර්ගයක් (Enumerated data type) හඳුන්වා දිය යුත්තේ කෙසේ ද?
(1) party : = (green,blue,red); (2) type var party = (green,blue,red);
(3) type party = (green,blue,red); (4) type party : = (green,blue,red);

32. පරිගණකය සඳහා උපදෙස් ලිවීම කෙසේ හැඳින්වේ ද?
(1) කේතනය කිරීම (Coding) (2) සම්පාදනය කිරීම (Compiling)
(3) දෝෂහරණය කිරීම (Debugging) (4) අර්ථකථනය කිරීම (Interpreting)

33. ස්ලයිඩ ප්‍රදර්ශනයක් (Slide show) ඉදිරිපත් කිරීම සඳහා පරිගණකයට සම්බන්ධ කළ හැකි උපක්‍රමය/උපක්‍රම (Devices) වන්නේ,
(1) විශාල තිර මොනිටරය (Large format monitor) (2) රූපවාහිනී යන්ත්‍රය (Television)
(3) ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Projector) (4) ඉහත ඕනෑම උපක්‍රමයක්

34. මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් (Microsoft Powerpoint) හි ශීර්ෂකය (Header) සහ පාදතලය (Footer) සම්බන්ධයෙන් සාවද්‍ය (False) වගන්තිය වන්නේ,
(1) සටහන් (Notes) සහ පත්‍රිකා (Handouts) සඳහා යොදා ගන්නා ඕනෑම ශීර්ෂකයක් හෝ පාදතලයක්, ලුහුඬු සටහනක් (Outline) සමඟ ද මුද්‍රණය කර ගත හැක.
(2) සටහන් හෝ පත්‍රිකා සඳහා නිර්මාණය කරන ලද ශීර්ෂක හා පාදතල, මුද්‍රණය වන සෑම පිටුවක් සඳහාම ඇතුළු වේ.
(3) ස්ලයිඩ නිර්මාණය කළ ආකාරයටම, වෙනස් පිටු සඳහා විවිධ ශීර්ෂක හා පාදතල ඇතුළු කිරීමට විකල්ප ලබා ගත හැක.
(4) ශීර්ෂක හා පාදතල යෙදීමේ දී, වැඩි ස්ලයිඩ ප්‍රමාණයකට ඇතුළු කළ යුතු එකම වර්ගයේ ඒවා මුලින් ඇතුළු කළ පසු, වෙනස් ශීර්ෂක හා පාදතල පසුව ඇතුළු කළ යුතුය.

35. පහත කුමන උපක්‍රමයක් (Device) ප්‍රතිදාන උපක්‍රමයක් (Output device) ලෙස පමණක් ක්‍රියා කරයි
   (1) චිත්‍රක ඵලකය (Graphic tablet) (2) ජාල කාඩ්පත (Ethernet card)
   (3) ස්පීකරය (Speaker) (4) දෘඪ තැටි ධාවකය (Hard disk drive)

36. පරිගණක ජාලයක් (Network) සඳහා අත්‍යවශ්‍ය නොවන්නේ,
   (1) මෙහෙයුම් පද්ධතිය (Operating system) (2) ජාලගත මුද්‍රකය (Network printer)
   (3) සන්නිවේදන මාධ්‍ය (Communication media) (4) සේවාදායකයා (Server)

37. පහත කුමන අනිෂ්ට මෘදුකාංගයක් (Malware) මගින් පරිගණක අපහාරකයෙකුට (Hacker) වෙ… පරිගණකයක සම්පූර්ණ පාලනය අතට ගැනීමට සහාය ලැබේ ද?
   (1) පරිගණක වෛරසය (Computer virus) (2) තාර්කික ප්‍රහාර (Logic bomb)
   3) පරිගණක වර්ම් (Worm) (4) ට්‍රෝජන් හෝස් (Trojan horse)

38. පරිගණකයක් මත ධාවනය වන වැඩසටහන් පිළිබඳ තොරතුරු හා අනෙකුත් දත්ත RAM හි ගබඩ… ඇත. RAM යනුවෙන් ප්‍රකාශ වන්නේ,
   (1) Rigid Access Memory (2) Random Access Memory
   (3) Rapid Access Memory (4) Real Autonomous Memory

39. කාපල් ටනල් සින්ඩ්‍රෝමය (Carpel Tunnel Syndrome) යනු,
   (1) කශේරුකාවට (Spine) හානි වීමයි.
   (2) වෛරසයකි.
   (3) මැණික් කටුවේ (Wrist) ඇති බලනහර (Tendons) ඉදිමීම හේතුවෙන් මධ්‍ය ස්නායුවට (Me… nerve) අමතර පීඩනයක් ඇති වීමයි.
   (4) තරුණ පිරිස කිසිසේත් බිය නොවිය යුතු තත්ත්වයකි.

40. පහත කුමක් ඇසෙහි පීඩාව (Eyestrain) හා හිසරදය ඇති වීමට හේතු වේද?
   (1) වියළි ඇස් (Dry eyes)
   (2) දූවිලි සහිත හෝ නොපැහැදිලි මොනිටරය (Blurred monitor)
   (3) දීර්ඝ වේලාවක් විරාමයක් නොමැතිව මොනිටරය වෙත දෑස් දල්වා බලා සිටීම
   (4) ඉහත සියල්ල